දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2018 පරීක්ෂණය (2015 පුනර්) - 2018 සැප්තැම්බර්/ඔක්තෝබර්
First Examination in Arts (External) 2018 (Repeat 2015) – September/October 2018

පාප්‍ර 1.2 - ව්‍යාකරණ, ගද්‍ය රචනය හා අනිර්දිෂ්ට ග්‍රන්ථ
PA 1.2 - Pali Grammar, Prose Composition & Unspecified Texts

කාලය පැය තුන යි

**පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටත් දෙවැනි කොටසින් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න**

---

## I කොටස

01. පහත සඳහන් ගද්‍ය ඡේදය සිංහලට නගන්න.

එකො කිර සාවත්ථිවාසී බ්‍රාහමණො අචිරවතී තීරෙ ඛෙත්ත කරණත්ථාය අරඤ්ඤං කොට්ටෙසි. සත්ථා තස්ස උපනිස්සයං දිස්වා සාවත්ථියං පිණ්ඩාය පවිසන්තො මග්ගා ඔක්කම්ම තෙන සද්ධිං පටිසන්ථාරං කත්වා "කිං කරොසි බ්‍රාහමණා"ති වත්වා "ඛෙත්තට්ඨානං කොට්ටාපෙමි භො ගොතමා"ති වුත්තෙ "සාධු බ්‍රාහමණ කම්මං කරොහී"ති වත්වා අගමාසි. එතෙනෙවුපායෙන ඡින්න රුක්ඛෙ හාරෙත්වා ඛෙත්තස්ස සොධන කාලෙ කසන කාලෙ කෙදාර බන්ධන කාලෙ වපන කාලෙති පුනප්පුනං ගන්ත්වා තෙන සද්ධිං පටිසන්ථාරමකාසි.

වපන දිවසෙ පන බ්‍රාහම්ණො "අජ්ජ භො ගොතම, මය්හං වප්ප මඞ්ගලං. අහං ඉමස්මිං සස්සෙ නිප්ඵන්නෙ බුද්ධ පමුඛස්ස සඞ්ඝස්ස මහා දානං දස්සාමී ති" ආහ. සත්ථා අධිවාසෙත්වා පක්කාමි. පුනෙක දිවසං බ්‍රාහමණො සස්සං ඔලොකෙන්තො ගන්ත්වා "කිං කරොසි බ්‍රාහමණා"ති පුච්ඡිත්වා "සස්සං ඔලොකෙමි, භො ගොතමා"ති වුත්තෙ "සාධු බ්‍රාහමණාති වත්වා පක්කාමි.

(ලකුණු 20 යි)

02. පහත සඳහන් පද්‍ය පංතිය සිංහලට නගන්න.

ඒකපුත්තං පසූතාහං – දුතියො කුච්ඡියා මම
තදාහං මාතාපිතරො – දක්ඛාමීති සුනිච්ඡිතා –

න රොචෙසි පති මය්හං – තදා තම්හි පවාසිතෙ
එකිකා නිග්ගතා ගෙහා – ගන්තුං සාවත්ථිමුත්තමං

තතො මෙ සාමි ආගන්ත්වා – සම්භාවෙසි පථෙ මමං
තදා මෙ කම්මජා වාතා – උප්පන්නා අති දාරුණා

උට්ඨිතො ච මහා මෙඝො – පසූති සමයෙ මම
දබ්බත්ථාය තදා ගන්ත්වා – සාමි සප්පෙන මාරිතො

තදා විජාත දුක්ඛෙන – අනාථා කපණා අහං
කුන්නදිං පූරිතං දිස්වා – ගච්ඡන්තී සකුලාලයං

බාලං ආදාය අතරිං – පරකූලෙ ච එකකං
සායෙත්වා බාලකං පුත්තං – ඉතරං තාරණායහං

නිවත්තා; උක්කුසො'හාසි – තරුණං විලපන්තකං
ඉතරඤ්ච වහී සොතො – සාහං සොක ස මප්පිතා

සාවත්ථි නගරං ගන්ත්වා – අස්සොසිං සජනෙ මතෙ
තදා අවොචං සොකට්ටා – මහාසොක ස මප්පිතා

"උභො පුත්තා කාලකතා – පන්ථෙ මය්හං පතී මතො
මාතා පිතා ච භාතා ච – එක චිතකම්හි ඩය්හරෙ

තදා කිසා ච පණ්ඩු ච – ආනාථා දීන මානසා
ඉතො තතො භමන්තීහං – අද්දසං නර සාරථිං

(ලකුණු 20 යි)

03. පහත සඳහන් ගද්‍ය ඡේදය පාලියට නගන්න.

එක් සමයෙක්හි වෛශාලිය සමෘද්ධිමත් ධනයෙන් පිරුණු ජනගහනයෙන් ගැවැසුණු නගරයෙක් විය. එහි වරෙකට රජ කරන ක්ෂත්‍රියයෝ සත් දහස් සත් සිය සත් දෙනෙක් වූහ. උන්ගේ විසුම සඳහා එපමණ ම ප්‍රාසාද හා කූටාගාර විය. විහරණය සඳහා එපමණ ම අරම් හා පොකුණු ද විය. ඒ නුවර පසු කලෙක්හි ධාන්‍යයෙන් විරල වැ දුර්භික්ෂ විය. සා දුකින් දුප්පත්තු පළමුවෙන් මිය ගියහ. ඒ ඒ තැන්වල දමාලූ උන්ගේ මළ සිරුරු ගඳින් හට ගත් අමනුෂ්‍ය උපද්‍රවයෙන් බොහෝ දෙනෙක් මිය ගියහ. කුණප දුගඳින් හටගත් පිළිකුල නිසා අහිවාතක රෝගය උපනි. මෙ සේ දුර්භික්ෂ භය, අමනුෂ්‍ය භය, රෝග භය, යන තුන් භය හට ගති. නුවර වැස්සෝ රැස්ව ''මහරජතුමෙනි, මේ නුවර තුන් බියෙක් උපනි. මින් පෙර සත්වන රජ පරපුර තෙක් මෙ බඳු බියක් හට ගත්තේ නැති. පෙර දැහැමි රජුන් දවස මෙ බඳු බියෙක් හට නො ගතියි'' පැවැසූහ. රජ සියල්ලන් රැස්වීම් ශාලාවට රැස් කරවා ''මාගේ නො දැහැමි බවක් ඇද්දැයි සොයා බලවු'' යැයි කීය. විසල් පුර වැස්සෝ පරපුර විමසා බලන්නාහු රජුගේ කිසිඳු දෙසක් නො දැක ''මහරජතුමෙනි, දෙසෙක් නැතැ''යි කියා කෙසේ නම් අපට හට ගත් බිය සන්සිඳු විය හැකි දැයි සාකච්ඡා කළහ.

(ලකුණු 20 යි)

## II කොටස

04. සන්ධි කාර්ය සිදුවන ආකාරය පහදා ව්‍යඤ්ජන සන්ධිය හඳුන්වා දෙන්න.

(ලකුණු 20 යි)

05. සමාස ප්‍රයෝජන දක්වා කම්මධාරය සමාසය උදාහරණ දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 20 යි)

06. විභක්ති ප්‍රත්‍ය නම් කර රාජ ශබ්දය සියලු විභක්තීන්හි වරනගන්න.

(ලකුණු 20 යි)

07. පඤ්චමී ආඛ්‍යාත විභක්තියෙහි අර්ථ ප්‍රකට කොට ගමු ධාතුව පඤ්චමී විභක්ති පරස්ස පදයෙහි හා අත්තනෝ පදයෙහි වරනගා දක්වන්න.

(ලකුණු 20 යි)

************************************************